පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

තුන්වන වාරය - සැප්තැම්බර් - සතිය - 02

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa

නිපුණතා මට්ටම : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

අරමුණු -

- පංච තූර්ය වර්ගීකරණය යන්න විස්තර කරයි
- පංච තූර්ය වර්ගීකරණය යන්න හදුනාගනියි
- සහයෝගයෙන් කටයුතු කරයි
- දැනුම හා අත්දැකීම් අනෙක් අය හා හුවමාරු කර ගනී
- සතුටින් විවේකය ගත කරයි

ක්‍රියාකාරකම : **<u>පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වාදන අවස්ථා පිළිබඳ තොරතුරු විමසමු.</u>**

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ 7,8 ශ්‍රේණිවලදී පහතරට බෙරය හා දවුල පිළිබඳව ඉගෙනගත් දෑ මතකයට ගන්න.

දෙවන පියවර : පහත සටහන කියවා, පහත ප්‍රශ්නවලට ඔබට පිළිතුරු සැපයීය හැකිදැයි බලන්න.

1. පංච තූර්ය වර්ගීකරණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. පංච තූර්ය භාණ්ඩ ලැයිස්තුවක් සකස් කරන්න.
3. පංච තූර්ය භාණ්ඩ රූප සටහන් ඇඳ නම් කරන්න.
4. පංච තූර්ය වාදනය කරන අවස්ථා නම් කරන්න.
5. පංච තූර්ය භාණ්ඩ ආරක්ෂා කර ගැනිමට සුදුසු යෝජනා හා අදහස් ඉදිරිපත් කරන්න.

සහායක ඉගෙනුම් ආධාරක

- e නැණ පියස - Course: 9 ශ්‍රේණිය නර්තනය
- වෙනත් youtube නාලිකා
    - තාල රංග you tube නාලිකාව - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය නර්තන අංශය
    -
- අතිරේක පොත්/ සඟරා - අත්රේක කියවීම් පොත 9 ශ්‍රේණිය නර්තනය

පංචතූර්ය යන නාමය නිර්මාණය වීම පිළිබඳ අනුරාධපුර සමයේ මත කිහිපයක් තිබේ. ලංකාවේ සංගීත සම්භවය සඳහන් වන පරිදි ,''පංච'' යන පදය ''වංශ'' යන්නෙන් හිදී ආවක් බවත් වංශ පදය දෙමළ ව්‍යවහාරයේ ''වංච''වූ බවත් ''පංච'' බවට පෙරළී ඇති බවත්ය. බ්‍රහ්මජාල සූත්‍රයේ වංශ හා පාණිස්සර තූර්‍ය භාණ්ඩ දෙකක් දක්වා තිබේ.සංගීතයට නළා වර්ග ලෝහයෙන් ලීයෙන් සතුන්ගේ අංග වලින් සාදාගෙන ඇත.වංශ යනු උණ හා බට ලීයෙන් තනා ගත් නළා ගත් නළා විශේෂයයි.මේවා පැරණිතම නළා විශේෂය හෙයින් වංශ තූර්ය නමින් හඳුන්වා ඇති අතර පසුව පංච තූර්ය වූ බව තවත් මතයකි. ''නත්තෘ පංචාංගික චරිවං කාස ආතතං විතතං ආතත විතතා නාම ශුෂිරය ඝනින්ති පංච විධෝ'' යනුවෙන් මහාවංශ ටීකාවේ සඳහන් වේ. වාද්‍ය භාණ්ඩ යනු විවිධාකාරයට වාදනය වන භාණ්ඩ එකතුවකි. මෙම භාණ්ඩ වාදනය කරන ආකාරය අනුව කොටස් 05 කට බෙදා දැක්විය හැකිය.  එනම් ආතත විතත විතතාතත ඝන සුෂිර යනුවෙනි

<u>ආතත-</u>අතින් පමණක් වාදනය කරන වාදන භාණ්ඩ වේ. උදාඃ-ගැටබෙරය,පහතරට බෙරය,උඩැක්කිය,රබාන

<u>විතත-</u>කඩිප්පුවක ආධාරයෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩ වේ. උදාඃ-තම්මැට්ටම

<u>විතතාතත -</u>අතින් සහ කඩිප්පුවෙන් වාදනය කරන වාදනය කරන වාද්‍ය භාණ්ඩ වේ. උදාඃ-දවුල

<u>ඝන-</u>මේ සඳහා ලෝහමය ද්‍රව්‍යවලින් නිර්මාණය කරගත් වාදන භාණ්ඩ ඇතුළත් වේ. උදාඃ-පන්තේරුව, තාලම්පට, තලිය, සිලම්බු, ගෙජ්ජි, ගෙජ්ජි

<u>ෂුසිර-</u>සුළගේ ආධාරයෙන් වාදනය කරනු ලබන වාදන භාණ්ඩ වේ. උදාඃ-බටනළාව,හක්ගෙඩිය,හොරණෑව

## <u>වාදනය කරන අවස්ථා</u>

ආගමික උත්සව- පෙරහැර පිරිත් පිංකම් තේවාවාදන ආදිය

<u>සමාජීය උත්සව -</u>ශාන්තිකර්ම තූර්ය වාදන සංදර්ශන ජාතික උත්සව අවමංගල්‍ය උත්සව